# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2118/78 - 2019 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2019.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: ඩීඅයිවීඅයිබී/එල්එන්ඩී/එල්ඒඩීජ්කියු/සීආර්පී/05/2015/16.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2016/එච්ඩබ්ලිව්/538.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තරය:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහළ විසිදෙකේ බටහිර කෝරළේ, සුළු කොට්ඨාසයේ, අංක 522, බක්මීගොල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පරණගම්පිටිය ගමෙහි සර්වේයර් ජනරාල්ගේ අවසාන ගම් පිඹුරු අංක 1187, අතිරේක අංක 4, පත්‍ර අංක 6 හා 2019.02.22 දිනැති මුලික පිඹුරේ කැබලි අංක 14902 (කැබලි 1 ක්) වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0299 පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල.

1. **කැබලි අංක 14902**

ඉඩමේ නම: වතුමුල්ලේකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: 13454 වෙනි බිම් කැබැල්ලේ කොටසක්. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ පවරාගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා සෙයියදු අහමදු නබිෂාන්. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා. (ව.මී. 299); ප්‍රමාණය: හෙක්. 0.0299.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2019 ජුනි මස 10 වැනි දින පෙ. ව. 9.30 ට ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019 මැයි මස 27 වන දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වාභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. ජේ. එස්. මාරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-1089



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.